

## මාඹය – කුඩාඹය සුරැකීමේ සංවිධානය කියයි

# නායයගිය අරණායක – මාවනැල්ලේ ඉතිරි ගස් ටිකත් කපන්න ජංගම ලී ඉරුම් පට්ටල් 20කට ආණ්ඩුව බලපත්‍ර දීලා

මාවනැල්ල -
කේ. වී. බණ්ඩාර

අරණායක, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කලාපවල නායයෑම් සිදුවී ව්‍යසනයන්වලට මුහුණ දී පාඩම් ඉගෙන ගන්නා විටත් ඉතිරි ගස් ටික විනාශ කිරීමට ජංගම ලී ඉරුම් පට්ටල් 20කට ආසන්න ප්‍රමාණයකට බලපත්‍ර නිකුත් කර ඇති බව මාඹය - කුඩාඹය සුරැකීමේ සංවිධාන පවසයි.

එම සංවිධානයේ සභාපති ගාමිණී ඇටම්පාවල මහතා සහ එහි ලේකම් චන්දන සෙනෙවිරත්න මහතා මාධ්‍යයට අදහස් දක්වමින් පැවැසුයේ මේ තත්ත්වය මත තම සංවිධානය පාසල් දරුවන් සහභාගි කරවාගෙන නාය ගිය අරණායක සාමසර හා ඒ අවට පරිසරය ආරක්ෂා කිරීම වෙනුවෙන් වෘක්ෂලතා 1000කට වැඩි ප්‍රමාණයක් සිටුවීමට තීරණය කරන බවත් එය ඉදිරි සතියේ ක්‍රියාවට නැංවීමට කටයුතු කර තිබූ අතර එම කටයුතු සියල්ල නවතා මෙවැනි පරිසර විනාශ කරන කටයුතු හෙළා දකින බවද පැවැසීය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මාඹය, කුඩාඹය සුරැකීමේ සංවිධානයේ සභාපති ගාමිණී ඇටම්පාවල මහතා මෙසේද පැවැසීය.

අද මේ රටේ පාලකයන්ට පරිසරය ආරක්ෂා කරන කිසිදු වැඩපිළිවෙළක් නැහැ. අරණායක පසුගිය අවුරුද්දේ මැයි 17 වැනිදා ලොකුම ව්‍යසනයක් වුණා. පරිසරය ආරක්ෂා වෙන කටයුතු සිදු වුණා නම් මෙහෙම විනාශයන් සිද්ධ වෙන්නේ නැහැ. වටිනා ජීවිත හානි, දේපොළ හානි රැසක් සිදු වුණා. මාසයකට බලපත්‍ර සහිත නොමා ලොරි 50කට වැඩිය අරණායකින් විතරක් මොරටුවට යනවා. ඒ මදිවට දැන් ජංගම ලී ඉරුම් පට්ටල් 10කට අරණායකට විතරක් බලපත්‍ර නිකුත් කරලා තියෙනවා. ඒ මදිවට ලී මෝල් 15ක් විතර අරණායක විතරක් තියෙනවා. ඉතින් අරණායක ඉතිරි වෙයිද. පරිසරයක් අනාගත පරපුර වෙනුවෙන් මෙවැනි



ප්‍රතිපත්ති තීන්දු තීරණ නිසා ඉතිරි වෙයිද. මේ වාගේ විසඳා ගත නොහැකි ගැටලු රැසකට අපි හිරවෙලා ඉන්නේ.

ඇත්තටම හදවතින් මේ කටයුත්තට අපි විරුද්ධයි. ඒ නිසා පරිසර ආරක්ෂක වැඩ අපේ සංවිධානයෙන් කරන්නේ නැතිව මේවා විසඳෙන තුරු නවත්වලා තියෙන්නේ යැයිද පැවැසීය.

කවදා හරි උමාඔයට වුණු ඛේදවාචකයත් මා ඔයට වෙන්න වැඩි කාලයක් ගත වෙන්නේ නැහැ. මාඔයත් මධ්‍යම පළාතෙන් පටන් අපේ ප්‍රදේශය හරහා ගමන් කරමින් තවත් ප්‍රදේශ කිහිපයකින්ම ගලාගෙන ගොස් මුහුදට වැටෙනකම් ජල සම්පාදන මණ්ඩලය ස්ථාන 18කින් පානීය ජලය ලබාදීමට ලබා ගන්නවා. විදුලි බලාගාර 3ක් මා ඔය ආරම්භක මොහොතේ





ක්‍රියාත්මකයි. මේ ළඟදී හෙම්මාතගම සහ ඒ අවට පවුල් 25,000කට ජලය දෙන්න තවත් ව්‍යාපෘතියක් පටන් ගත්තා. කිසිම පරිසර සංවිධානයක අනුමැතියක් නැතිව පක්ෂ මහ ලේකම් කබීර් හෂීම් මහත්තයා. දේශපාලනඥයන් මේ හැම දෙයක්ම කරන්නේ ඔවුන්ගේ පැවැත්මට මිස පරිසරයට තියෙන ආදරයකට නොවෙයි. මේ විදියට වතුර ගන්න මේ මා ඔයේ දැන් වතුර නැහැ. තේ මණ්ඩලය පරිසරය ගැන හිතන්නේ

නැතිව මා ඔය පටන් ගන්න අසුපිනි ඇල්ල දෙපැත්තේ තේ වගා කරලා ජලය රැඳෙන ගස් ටික කපන්න අවසර දීලා. ඒ වාගේම පාරක් කපලා ඒ පැත්තම දැන් කාන්තාරයක් වෙලා. ජලය නොමැතිකමින් අරණායක කන්න තුනක් වී වගාව කරලා නැහැ. 1975 නියඟයක් ඇවිත් එක කන්නයක් වී වගා කළේ නැහැ. දැන් මොකද වෙලා තියෙන්නේ නියඟයක්



ගාමිණී ඇටම්පාවල

නිසා නොවෙයි. මේ වගා කරන්නේ නැත්තේ මා ඔයෙහි වතුර නැහැ. එහෙම නම් ජලය නැති වුණේ කුමක් නිසාද අක්‍රමවත් පරිසර හානිය නිසා නොවෙයිද? කවුද වගකියන්න ඕනෑ. දේශපාලනඥයන් සහ ඔහුන්ගේ කටයුතු ක්‍රියාවට නංවන නිලධාරීන් නොවෙයිද?

එසේම මේ ජංගම ලී ඉරුම් පට්ටල් මඟින් අවසර නොවන ගස් බොහෝමයක් දිවා රාත්‍රී කපා පෞද්ගලික වාසියට කටයුතු කරන බවද හෙතෙම පවසයි.

අපි අවසාන වශයෙන් ඉල්ලන්නේ මේ පරිසරය ආරක්ෂා කරන්න ජනාධිපතිතුමා හරි ලෝක සංවිධානයක් හරි මැදිහත් වෙලා කටයුතු කරන්න කියලා විතරයි. කවදා හරි වෙන්නේ දැන් ඉන්ධන නැතිව පෝලිම්වල ඉන්න ජනතා වාගේ වතුර නැතිව පෝලිම්වල ජලය ලබාගන්න මිනිස්සු ටිකක් විතරයි.

අප මේ සම්බන්ධයෙන් අඩවි වන කාර්යාලයේ මාවනැල්ලෙන් විමසීමක් කළ අවස්ථාවේ එහි නිලධාරියකු පවසා සිටියේ අදාළ ජංගම ලී ඉරුම්හල්වලට ලබා දී ඇති කොන්දේසිවලට එක්ගව ගස් කැපිය හැකි නමුත් නීති විරෝධී ලෙස වෘක්ෂලතා කපා දමන්නේ නම් නීතිය හමුවට පමුණුවන බවයි. නැවත අවසර ජංගම ඉරුම්හල්වලට ලබා දීම සම්බන්ධයෙන් විමසන හෙතෙම මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ප්‍රධාන කාර්යාලයෙන් අසා දැන ගන්නා ලෙසද අප සමඟ පැවැසීය. මාවනැල්ලේ මේ වන විට ජංගම ලී ඉරුම් යන්ත්‍ර 7ක් සහ රඹුක්කන 8කට පමණ බලපත්‍ර නිකුත් කර ඇති බවද එම නිලධාරියා පැවැසීය.



# මහජන සහයෝගය නැතිව

# මාවනැල්ලේ